# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1805/27 – 2013 අප්‍රේල් 10 වැනි බදාදා – 2013.04.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: සිය/ප්‍රාලේ/ආ සං 05/2/ඉ/4/එල්ඒ.
ඉඩම් අමාත්‍යාංශයේ අංකය: 03/ජේ/78/පී/412.

කොළඹ - රත්නපුර, වැල්ලවාය - මඩකලපුව පාරේ 174/8 පාලමට පිවිසීමේ මාර්ගය සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට රජය අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

ඌව පළාතේ, මොනරාගල දිස්ත්‍රික්කයේ, සියඹලාණ්ඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උල්විට ගමේ පිහිටි මොනරාගල මැනුම් අධිකාරි විසින් පිළියෙල කර ඇති අ. හු. පි. 54A, අතුරු පිඹුරු අංක 24 හි දැක්වෙන ඉඩම:

01. **කැබලි අංක 250**
ඉඩමේ නම: පහළවෙලේ යාය; හිමිකම් කියන අය: පූජ්‍ය මැල්ල ගම සෝමානන්ද හිමි, කොටියාගොඩ විහාරය, දොඹගහවෙල; ප්‍රමාණය: හෙක්. 0.0313.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2013 මැයි මස 08 වැනි දින පෙ.ව. 10.00ට සියඹලාණ්ඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2013 මැයි මස මස 01 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ඒ. එම්. නන්දසිරි,
ප්‍රාදේශීය ලේකම්,
සියඹලාණ්ඩුව.

2013 මාර්තු මස 18 වැනි දින,
සියඹලාණ්ඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

04 – 770


1A – G17550 – 350 (2013/04) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*